**මාධ්‍ය ප්‍රකාශය**

# ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මහජන චීන සමූහාණ්ඩුවේ සාර්ථක රාජ්‍ය සංචාරයක නියැලෙයි

මහජන චීන සමූහාණ්ඩුවේ ජනාධිපති අතිගරු ෂී ජින්පින්ග් මැතිතුමාගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2015 මාර්තු 25 – 27 දිනවලදී මහජන චීන සමූහාණ්ඩුවේ රාජ්‍ය සංචාරයක නියැලිණි. මෙම සංචාරයේදී, සිරිසේන ජනාධිපතිතුමා, චීන අග්‍රාමාත්‍ය අතිගරු ලී කෙකුයැන්ග් මැතිතුමා සහ චීනයේ ජාතික මහජන කොන්ග්‍රසයේ ස්ථාවර කමිටුවේ සභාපති අතිගරු ෂැන්ග් ඩෙජිඇන්ග් මැතිතුමා හමුවිය. අතිගරු ජනාධිපතිතුමා තෝරා පත්කර ගැනීමෙන් මාස තුනක් ඇතුළත නිරතවූ මෙම සංචාරය ජනාධිපති සිරිසේන මැතිතුමගේ පළමු චීන සංචාරය විය.

මාර්තු 26 වැනි දා පැවති ද්විපාර්ශ්වික සාකච්ඡාවලදී දෙරටේ නායකයෝ, ද්විපාර්ශ්වික දේශපාලන සබඳතා පිළිබඳව සහ අනෙකුත් කරුණු අතර සංවර්ධන සහයෝගිතාව ඇතුළුව ආර්ථික සහයෝගිතාව, වෙළෙඳාම, ආයෝජන හා සංචාරක කටයුතු, සංස්කෘතික සහයෝගිතාව සහ දෙරටේ ජනතාව අතර සබඳතා යන අන්‍යොන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර විශාල ප්‍රමාණයක් ආවරණය වන පරිදි උණුසුම් හා මිත්‍රශීලී ලෙස අදහස් හුවමාරු කර ගැනීමක නියැලුණහ.

චීනය, ශ්‍රී ලංකාවේ නව රජය සමඟ කටයුතු කිරීමට දක්වන මහත් උනන්දුව පිළිබඳව ජනාධිපති සිරිසේන මැතිතුමා සතුට පළ කළේය. නව රජයේ ප්‍රතිපත්තිය පිළිබඳව සහ යහපාලනය, නීතියේ ආධිපත්‍යය හා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා 2015 ජනවාරි 08 වැනි දින ශ්‍රී ලාංකික ජනතාව තමා වෙත ලබාදුන් ජනවරම පිළිබඳව සහ යෝජිත ව්‍යවස්ථාමය සංශෝධන ඇතුළුව රජයේ දින 100 වැඩසටහන සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය පිළිබඳව ජනාධිපති ෂී ජින්පින්ග් මැතිතුමාට කරුණු පැහැදිලි කළේය. දූෂණය මුලිනුපුටා දමන සහ යහපාලනය ප්‍රවර්ධනය කරන ෂී ජින්පින්ග් මැතිතුමාගේ ව්‍යාපාරයෙන් ජනාධිපති සිරිසේන මැතිතුමාගේ රජය ආදර්ශයක් ලබාගෙන තිබෙන බව එතුමා පැවසීය. ජාතික ප්‍රතිසන්ධානය හා රටේ සාමය හා මානව හිමිකම් තහවුරු කරන විනිවිදභාවයකින් යුතු හා අවංක ක්‍රියාදාමයක් සමඟ නව රජය ඉදිරි කටයුතු සිදුකරන බවත්, මේ සඳහා ජාත්‍යන්තර ප්‍රජාව සමඟ හවුල්කාරිත්වයක් ගොඩනගා ගැනීමට කටයුතු කරන බවත් ජනාධිපති සිරිසේන මහතා චීන ජනාධිපතිවරයාට ප්‍රකාශ කළේය.

ශත වර්ෂ ගණනාවක් පුරා දිවයන හා දීර්ඝ කාලයක් පුරා යහපත් අන්දමින් සබඳතා භුක්ති විඳ තිබෙන ශ්‍රී ලංකාව හා චීනය සර්වකාලීන මිතුරන් වන බව නායක දෙපළ මෙහිදී අවධාරණය කළහ. ද්විපාර්ශ්වික සබඳතා සහ මිත්‍රත්වයේ දැඩි සබඳතා, අන්‍යොන්‍ය ගරුත්වය හා අවබෝධය හා පොදුවූ සංස්කෘතික සාරධර්ම මත පදනම්වී ඇති බව ඔවුහු තහවුරු කර සිටියහ. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ අඛණ්ඩ ස්ථාවරයක්ව පවතින “එක් චීන දේශයක්” යන ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට ශ්‍රී ලංකාවේ ඇපකැපවීම ජනාධිපති සිරිසේන මැතිතුමා අවධාරණය කළේය. ශ්‍රී ලංකාව සහ චීනය සාමකාමීව සහජීවනයෙන් ජීවත්වීමේ හා පංචශීලයේ මූලධර්ම පහ පිළිපදින රටවල් දෙකක් බවද නායක දෙපළ අවධාරණය කළහ. ත්‍රස්තවාදය පැරදවීමේදී මෙන්ම රටේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව තහවුරු කිරීමේදී චීනය විසින් ලබාදුන් ස්ථිරසාර සහාය ජනාධිපති සිරිසේන මහතාගේ දැඩි ප්‍රශංසාවට ලක්විය.

2014 සැප්තැම්බර් මසදී ජනාධිපති ෂී ජින්පින්ග් මැතිතුමා ශ්‍රී ලංකාවේ නිරතවූ ඓතිහාසික රාජ්‍ය සංචාරයේ ප්‍රතිඵලයක් ලෙස දෙරට අතර සහයෝගිතා පාර්ශ්වකාරිත්වය තවදුරටත් තහවුරු වූ බවටත් ද්විපාර්ශ්වික සබඳතා නව විශිෂ්ටතා මට්ටමක් කරා ඉහළ නැංවීම සඳහා සහහෝගිතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්න දරන බවටත් දෙපාර්ශ්වයම එකඟ වූහ.

ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායානුකූල නොබැඳි ප්‍රතිපත්තිය පිළිබඳව සඳහන් කරමින්, ආර්ථික සහයෝගිතාව වඩවඩාත් වර්ධනය කරගැනීම සඳහා 21 වැනි ශත වර්ෂයේ සමුද්‍රික සේද මාවත පිළිබඳව චීනය දක්වන උනන්දුවට සහාය ලබාදෙන බව ශ්‍රී ලංකාව ප්‍රකාශ කළාය. සියල්ල ඇතුළත් හා අන්තර් සබඳතා ඇති නව ලොවක මිත්‍රත්වය, ආර්ථික සහයෝගිතාව සහ සංස්කෘතික හා සමාජීය හුවමාරු සඳහා ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකාව අදහස් දක්වන මෙම සංකල්පය පිළිබඳව සොයා බැලීමට ජනාධිපති සිරිසේන මැතිතුමා කැමැත්තෙන් පසුවන බව ප්‍රකාශ කළේය.

සාකච්ඡා මට්ටමේ පවතින යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමේ කටයුතු සාර්ථකව නිම කිරීම සඳහා නායක දෙපළ එකඟ වූ අතර, ද්විපාර්ශ්වික වෙළෙඳ හා ආර්ථික සබඳතාවල නව පරිච්ඡේදයක් ආරම්භ කිරීමට මෙමඟින් ඉඩකඩ සලසා දෙනු ඇත. බලය, ජනගහන ප්‍රමාණය වැනි දෙරට අතර පවත්නා අසමමිතිකතා හමුවේ, සමානාත්මතාවයේ හා අන්‍යොන්‍ය ගරුත්වයේ මූලධර්ම මගින් දෙරට එක්කොට බැඳ තබා ඇති බව හඳුනාගන්නා අතර නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳ අවංක ප්‍රගතියක් අත්කර ගැනීමට ශ්‍රී ලංකාව උනන්දුවක් දක්වන බව ජනාධිපති සිරිසේන මැතිතුමා පැවසීය.

මෙම සංචාරයේදී, ජනාධිපති ෂී ජින්පින්ග් මැතිතුමාගේ ආරාධනයෙන්, ජනාධිපති සිරිසේන මැතිතුමා ලොව වෙනත් නායකයන් හා ගෝලීය ව්‍යාපාරික ප්‍රජාව ඒකරාශී කරන හයිනෑන් ප්‍රාන්තයේ බොආඕ හි මාර්තු 28 වැනි දින පවත්වන 2015 ආසියා වාර්ෂික සමුළුව සඳහා බොආඕ සංසදයට ද සහභාගිවීමට නියමිතය. ආසියා සමුළුව සඳහා බොආඕ සංසදය මඟින් ආසියානු රටවල හා ලෝකයේ වෙනත් රටවල නායකයින් හා ගෝලීය ව්‍යාපාරික ප්‍රජාව ඒකරාශී කොට ඵලදායී සංවාදයක් සඳහා වේදිකාවක් සපයා දෙයි. ජනාධිපතිතුමා, "ආසියාවේ අලුත් අනාගතය : පොදු ඉරණමක් ඇති ප්‍රජාවක් උදෙසා" යන තේමාව යටතේ ආසියා වාර්ෂික සමුළුව සඳහා බොආඕ සංසදය ඇමතීමට ද නියමිතය.

විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර, මුදල් අමාත්‍ය රවි කරුණානායක, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය ගරු රාවුෆ් හකීම්, විදුලිබල හා බලශක්ති අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු ආචාර්ය විජයදාස රාජපක්ෂ, ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා, වැවිළි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍ය ගරු ජගත් පුෂ්පකුමාර, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, චිත්‍රාංගනී වාගීෂ්වර, චීනයේ ශ්‍රී ලංකා තානාපති රංජිත් උයන්ගොඩ යන මහත්ම මහත්මීහු හා ජනාධිපති ලේකම් කාර්යාලයේ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ හා බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිහු ජනාධිපති සිරිසේන මැතිතුමා සමඟ මෙම සංචාරයට එක්වූහ.

විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ
2015 මාර්තු 27